# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

| සිංහල | 1 වසර | කාලය පැය 2 යි |
|---|---|---|

* පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 100කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. වැඩිහිටියන්ට සලකමු.
ii. මා ගිය විනෝද ගමන.
iii. අපේ ගුරුවරු.
iv. සතුන්ට ආදරය කරමු.
v. පොත් අපේ මිතුරෝ ය. (ලකුණු 25යි)

02. (අ) ක , ච , ට , ත , ප , අකුරුවලට අදාළ මහාප්‍රාණ අකුරු ලියන්න. (ලකුණු 05යි)

(ආ) වම්පස හරස් ඉරක් සහිත අකුරු පහක් (05) ලියන්න. (ලකුණු 05යි)

(ඇ) පහත සඳහන් පිල්ලම් නම් කරන්න.

ා , ැ , ් , ි , ු (ලකුණු 05යි)

The National e-learning Portal for The General Education

03. (අ) හිස්තැන් පුරවන්න.

i. ච____වා____ගොඩ
ii. ____න්ගි____ද____ල්ල
iii. ගල්____ඩග ____
iv. ග ____ලා____ ____ය
v. පො____ප____ප්පුව (ලකුණු 05යි)

(ආ) ප්‍රාණවාචී නාම පද 10ක් සහ අප්‍රාණවාචී නාම පද 10ක් ලියන්න. (ලකුණු 10යි)

04. (අ) පහත සඳහන් නම් අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

ගම්පොල , කෑගල්ල , අනුරාධපුරය , හම්බන්තොට , යාපනය , මාතර , බලපිටිය , සීගිරිය , ත්‍රිකුණාමලය , නාවලපිටිය (ලකුණු 05යි)

(ආ) වරහන් තුළ ඇති වචන අතුරින් සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

i. ................................ගමට යයි. (ඔවුහු , ඔහු)
ii. ................................සෙල්ලම් කළේ ය. (ඔහු / ඇය)
iii. ................................රූපවාහිනිය බලහු (නුඹ/නුඹලා)
iv. ................................පාසල වෙත පිය නැගුවා ය(ගුරුවරයා/ගුරුවරිය)
v. ................................පොත පාඩම් කරමි(මම/අපි) (ලකුණු 05යි)

ඇ. පහත සඳහන් ඒක වචන නාමපද බහු වචනයට හරවා ලියන්න.

i. ගුරුවරිය    ii. පුටුව    iii. බල්ලා    iv ගොවියා    v. පන්සල (ලකුණු 05යි)

05. (අ) පහත සඳහන් පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

i. කුකුළා    ii. බමුණා    iii. කොකා    iv. රජු    v. ඇතා (ලකුණු 05යි)

(ආ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

i. දුදන    ii. මහලු    iii. කුරුල්ලා    iv. අහස    v. අවංක (ලකුණු 05යි)

(ඇ) පහත සඳහන් පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

i. ජලය    ii. චන්‍ද්‍රයා    iii. ගස    iv. මව    v. සූර්යයා (ලකුණු 05යි)

06. (අ) සුදුසු ක්‍රියා පද යොදා හිස්තැන් පුරවන්න.

i. ළමයි බයිසිකල් ............... (පදියි/පදිති)
ii. අම්මා මල්ලීට කිරි ...................(පෙව්වේය/පෙව්වාය)
iii. අපි ඉරිදා පොළට (ගියෙමු/ගියෙහි)
iv. ඔවුහු විවාද තරගයෙන් ජය ................ (ලැබූහ/ලැබීය)
v. තෙපි වැඩ ................ (කරති/කරහු) (ලකුණු 05යි)

(ආ) සුදුසු විරාම ලක්ෂණ යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. දිනකට පැය කීයක් තිබේ ද
ii. අනේ සිදුවූ විපතක තරම
iii. අපි පන්සල් ගියෙමු
iv. සුබ අලුත් අවුරුද්දක් වේවා
v. ලෝකයට සාමය උදා වේවා (ලකුණු 05යි)

(ඇ) සචේතනික නාම පද මුලට යොදා වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05යි)

07. පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.

(අ) i. සිත මිස කය නැති බඹ ලොව සතර කි
.................................................................. ....

ii. කන්නන් මෙන් විස අඹ පල රිස් සේ
.......................................................... ....... (ලකුණු 10යි)

(ආ) පහත සඳහන් අර්ථය අපැහැදිලි වාක්‍යවල පද මාරුකර අර්ථවත් වාක්‍ය තනන්න.

i. මිනිස්සු පාරේ මහලු ඇවිදිති සෙමින්
ii. ලෙඩුන් කරති වෛද්‍යවරු සුවපත්
iii. පැන යති හාවෝ පැන
iv. කරති මල් පූජා උපාසිකාවෝ
v. කළේය අවවාද සිසුන්ට ගුරුවරයා (ලකුණු 05යි)

08. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. මඩොල්දූව නවකතාව රචනා කළ ලේඛකයා කව්ද?
ii. වැදි සන්නියෙන් පසුව උපාලි ගිනිවැල්ලට ලැබුණු දඬුවම කුමක්ද?
iii. උපාලි ගිනිවැල්ලගේ දඟ වැඩ සඳහා ඔහුත් සමග සිටි අනිත් යහළුවන් කව්ද?
iv. සුරංචියා හෙවත් කොළඹ රාල යනු කව්ද?
v. උපාසක අප්පුගේ වත්තේ කජු සොරකම් කිරීමෙන් පසු ගමේ පැතිරගිය කතාව කුමක්ද? (ලකුණු 15යි)